# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2012 ජුනි මස 01 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2012.06.05 දින නිකුත් කරන ලදී)**


# වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

*(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)*

**වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජානක බණ්ඩාර මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)

## වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආාර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2012 අංක     දරන වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දුප්පත් අසරණ ජනතාවට මෙන්ම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් සහ ආහාර ද්‍රව්‍ය සපයා දීම;

(ආ) ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාර සේවා පැවැත්වීම සහ ශිෂ්‍යත්ව, පුස්තකාල පහසුකම් සහ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ආධාර ලබා දීම;

(ඇ) පහ වසරේ ශිෂ්‍යත්ව, අ.පො.ස. (සා. පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා පෙනී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා අධ්‍යාපන විශේෂඥයන් යොදවා විශේෂ උපකාරක පන්ති පැවැත්වීම;

(ඈ) ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටු කරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරි ගැන්වීම;

(ඉ) සියලුම ආගම්වලට අයත් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි අවස්ථාවල උපකාර වීම;

(ඊ) පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අදහස ඇතිව සංවර්ධන වැඩමුළු, දේශන, ප්‍රදර්ශන සහ අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම;

(උ) අඟහිඟකම් ඇති ළමයින්ගේ කුඩා කල ළමා සංවර්ධනය සඳහා පෙර පාසල් සංවර්ධනය සඳහා කටයුතු කිරීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි ලා යෙදී සිටින යම් නිලධරයකුට හෝ සේවකයකුට ශිෂ්‍යත්ව මගින් ආධාර දීම;

(එ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඇති මේ හා සමාන සංගම් සමග සහයෝගය, සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම;

(ඒ) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාර සේවා නියුක්තිකයින් සංවිධානගතකොට ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම;

(ඔ) ශ්‍රී ලංකාව තුළ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා පාරිසරික සංවර්ධන, කටයුතු ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම හා ඊට අවශ්‍ය උපදේශන සැපයීම;

(ඕ) නාස්තිය හා දූෂණය පිටු දකිමින් අප ප්‍රජාව සතු සියලු සම්පත් ඉතා ප්‍රයෝජනවත් මට්ටමින් උපයෝජනය කිරීම;

(ක) ළමා හා කාන්තා සංවර්ධනය සඳහා වූ සමාජ සජීවිකරණ වැඩසටහන් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම, ඒ සඳහා අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ග) අඩු සමාජ තල සහිත පවුල්වල තරුණ තරුණියන්ට ස්වයං රැකියා අවස්ථා ලබා ගැනීමට හැකි වන පරිදි කාර්මික, කර්මාන්ත හා පරිගණක වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා වැඩසටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ච) පාසල් යා යුතු වයසේ සිටින එහෙත් විවිධ හේතූන් නිසා පාසල් නොයන දරුවන් හඳුනා ගෙන ඔවුන්ට මූලික අධ්‍යාපනයක් ලබා දීම හා ඔවුන් රජයේ පාසල් සඳහා යොමු කිරීම හෝ ඔවුන්ගේ අධ්‍යාපන හා සමාජ කටයුතු සඳහා ආධාර උපකාර කිරීම හා ඉහත හඳුනාගත් පවුල්වල සංවර්ධනය සඳහා සමාජ, ආර්ථික ආධාර කිරීම;

(ජ) කෘෂි කර්මාන්තයේ යෙදී සිටින තරුණ තරුණියන්ට අවශ්‍ය පුහුණු වීම් ලබාදීම සහ අපනයන බෝග වගාවන් සඳහා යොමු කිරීම හා ඊට අවශ්‍ය දේශීය හා විදේශීය වෙළඳ කටයුතු සංවිධානය කිරීම හා වගාවන් සඳහා අවශ්‍ය ඉඩ ලබා දීම;

(ට) ස්වාභාවික ආපදාවල දී හා හදිසි ආපදා හා අනතුරුවල දී ආධාර උපකාර කිරීම;

(ඩ) උසස් අධ්‍යාපනයට හිමිකම් නොලබන තරුණ තරුණියන්ට ඉංජිනේරු, කාර්මික, වඩු කාර්මික, පෙදරේරු, රියදුරු හා පරිගණක කෙෂ්ත්‍රවල වෘත්තීය පුහුණුව ලබා දීම හා ඔවුන් එම වෘත්තීන්වලට යොමු කිරීම හා ඒ සඳහා අවශ්‍ය පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම;

(ණ) වැඩිහිටියන්, ආබාධිත සහිත වූවන් සඳහා වැඩිහිටි නිවාස හා අසරණ දරුවන් සඳහා ළමා නිවාස, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පෙර පාසල් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම හා දැනට අසීරුවෙන් පවත්වාගෙන යනු ලබන ඉහත කී ආයතනවලට ආධාර උපකාර කිරීම; සහ

(ත) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන්පමුණුවා ගැනීමට අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ එවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්‍ර, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු

කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සංස්ථාගත කළ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ, යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම;

(ඊ) විවිධ සාමාජිකයන්ගේ වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප් දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, අධ්‍යක්ෂ ජනරාල්, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන හත් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උපලබ්ධි වුව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපල වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයන් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් හා ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේද යන්න සංස්ථාව විසුරුවා හරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හේ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන්වනු ලබන 431 වන අධිකාරය වන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනතේ 13 වන වගන්තිය සංශෝධනය කරන අතර සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු රාජ්‍ය සේවයට ඇතුළත් වූ සහ (1) වන උපවගන්තිය යටතේ විශ්‍රාම යාමකට හෝ ඉවත් කිරීමකට පෙරාතුව වසර දහයක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති රජයේ නිලධරයකු ඉහතකී වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රතිලාභවලට සුදුසුකම් ලැබීමට සැලැස්වීම වන්නේ ය.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිවම 27අ සහ 27ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධන කරන අතර එකී වගන්තිවල නීතියේ බලපෑම පහත දැක්වෙන පරිදිවේ එනම්—

(අ) 27අ වගන්තිය මගින්—

(අ) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් විශ්‍රාම යාමේ වයසට පෙර මිය යන රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට එකී නිලධරයා මිය ගිය දින සිට, ඔහුගේ විශ්‍රාමයාමේ දින දක්වා, ඔහු එසේ මිය ගිය දිනවන විට ලැබූ වැටුපට සමාන විශ්‍රාම වැටුපක් ලැබීමටත්, එකී විශ්‍රාම යාමේ දිනයෙන් පසු මේ පනතේ විධිවිධාන අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබූමටත් හිමිකම සලසනු ලැබේ.

(2) හදිසි නීති නියෝග යටතේ වරදක් සංයුක්ත කරනු ලබන ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සේවයේ නියුක්තව සිටිය දී මිය යන රජයේ සේවයේ අනියම් සේවකයකුගේ වැන්දඹුවට හා දරුවන්ට එකී තැනැත්තා මිය ගිය දින සිට ඔහු එසේ මිය ගිය දින වන විට ලබමින් සිටි ගෙවීමට සමාන ගෙවීමක්, ඔහු ජීවත්වූයේ නම් ඔහුට වයස අවුරුදු පනස් පහ එළඹෙන දින දක්වා ලැබීමටත්, වයස අවුරුදු පනස්පහ ඉක්ම වූ පසු, මේ පනතේ විධි විධානවලට අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමටත් හිමිකම් සලසනු ලැබේ.

(ආ) 27ආ අලුත් වගන්තිය මගින් විශ්‍රාම වැටුප් සංග්‍රහයේ ට උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන නිලධරයකුගේ වැන්දඹුවට එකී නිලධරයාගේ මරණින් පසු ඔහු විශ්‍රාම යාමේ දී ලබන ලද වැටුප මත ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට විධිවිධාන සලසනු ලබයි.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරන ලබන අතර සංශෝධිත පරිදි එකී වගන්තියේ නීතිය බලපෑම වන්නේ වයස අවුරුදු 26 ට අඩු ගැහැණු අනත් දරුවකුට ඇයගේ පියාගේ මරණින් පසු, ඇය විවාහක ස්ත්‍රියක වුව ද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම සැලසීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පරිච්ඡින්න කොට අලුත් වගන්තියක් ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, අලුත් වගන්තියේ නීතියේ බලපෑම වන්නේ සිවකීය ස්වාමිපුරුෂයාගේ අවෑමෙන් පසු විශ්‍රාම වැටපක් ලබමින් සිටින වැන්දඹුවක නැවත විවාහ වූ විටක එකී විශ්‍රාම වැටුපෙන් භාගයක් ලැබීමටත්, යම් හෙයකින් එකී නැවත විවාහක අවලංගු වූ විටකදී වුව ද, එහි කොටසක් නොවන ලෙසටත් එකී දෙවන විවාහය නිසා ඇයට අහිමි වූ කොටස පළමු විවාහයේ දරුවන්ට ලැබීමටත් විධිවිධාන සැලසීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට අලුත් උපවගන්තියක් එකතු කරන අතර එකී අලුත් උපවගන්තියේ නීතියේ බලපෑම වන්නේ විශ්‍රාම ගැනීමේ නියමිත දින සිට පෙර ධූරය අහෝසි කිරීම මත රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලබන සහ අරමුදලට දායක මුදල් ගෙවීම නතර කරනු ලැබූ රජයේ නිලධරයකුහට විශ්‍රාමයාමේ දිනයෙන් පසු ඔහු විසින් ඇතුළත් වන විවාහයක් සම්බන්ධයෙන් දායක මුදල් ගෙවීම ආරම්භ කිරීමට සැලසීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන වගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය සංශෝධනය කරන අතර, සංශෝධනයේ නීතියේ බලපෑම වන්නේ, නියමිත දින හෝ ඊට පසු දායකයකු වන රජයේ නලධරයකු වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම වැටුපකට හිමිකම නොලබා රජයේ සේවය හැර ගිය විටක, ඔහුගේ මරණින් පසු ඔහු විසින් අරමුදලට ගෙවන ලද දායක මුදල් මත පදනම් වූ විශ්‍රාම වැටුපකට ඔහුගේ වැන්දඹුව සහ දරුවන්ට හිමිකම ලබාදීම වේ.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්

(අ) අරමුදලේ දායකයකු වූ රජයේ නිලධරයකු මේ පනතේ 27අ වගන්තියේ () වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක ඔහුගේ වැන්දඹුව හා දරුවන්ට එකී (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි සහ

(ආ) රජයේ සේවයේ තාවකාලික හෝ අනියම් සේවකයකු ලෙස ධූර දරමින් සිට සේවයේ සිටියදීම, මේ පනතේ 27අ වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් අවස්ථානුගත හේතුමත, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර මියගිය විටක, ඔහුගේ වැන්දඹුවට හා දරුවන්ට එකී (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමට සලසනු ලබයි.

***9 වන වගන්තිය*** : මේ වගන්තිය මේ පනතේ 8 වන වගන්තියේ කරන ලද සංශෝධනයට ආනුශංගික වේ.

***10 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් මේ පනතේ 5, 6 සහ 7 වන වගන්තිවල විධිවිධාන අතීතයට බලපෑමට සලසනු ලබන්නේ ය.